# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2009 අංක 10 දරන සත්ව
## (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 මාර්තු මස 17 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---


2009 මාර්තු මස 20 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ**
**ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක්
වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 4.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

## 2009 අංක 10 දරන සත්ව (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2009 මාර්තු මස 17 වන දින]

එල්. ඩී.—ඕ. 62/2006.

### 1958 අංක 29 දරන සත්ව පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2009 අංක 10 දරන සත්ව (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" වශයෙන් සඳහන් කරනු ලබන) 1958 අංක 29 දරන සත්ව පනතේ "3අ" වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන "3අඅ" වශයෙන් බලාත්මක විය යුතු අලුත් වගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— — 1958 අංක 29 දරන පනතේ 3අඅ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"වැරදි සිදු කර ඇත්තේ යම් සතුන්ට එරෙහිව ද එම සතුන් සඳහා රැකවරණ ලබා දීම.

3අඅ. (1) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, සතකු සම්බන්ධයෙන් යම් වරදක් සිදු කරනු ලැබ ඇති හෝ සිදු කරනු ලැබීමට ප්‍රයත්න දරා ඇති අවස්ථාවක දී, සහ එකී වරද, එම වරද සිදු කරන ලද හෝ සිදු කරනු ලැබීමට ප්‍රයත්න දරන ලද අධිකරණ බල ප්‍රදේශයේ මහෙස්ත්‍රාත්වරයාගේ අවධානයට යොමු කර ඇති විටදී එකී මහෙස්ත්‍රාත්වරයා විසින් , එම නඩු විභාගය අවසාන වශයෙන් තීරණය කරන තෙක් එම වරද සිදු කර ඇත්තේ යම් සතකුට එරෙහිව ද එම සතා—

(අ) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයන් මඟින් අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද යම් සත්ව රැකවරණ මධ්‍යස්ථානයක භාරයට බාර දෙන ලෙසට;

(ආ) සතුන්ගේ සුබසාධනය සිය මූලික පරමාර්ථය වන්නා වූ යම් රාජ්‍ය නොවන සංවිධානයක් වෙත බාර දෙන ලෙසට;

(ඇ) සතුන් රැක බලා ගැනීම සක්‍රීය ලෙස යෙදී සිටින සහ තම මූලික අරමුණ සතුන්ගේ සුබසාධනය බවට අධිකරණය සෑහීමට පත්

2—PL 003362-3,500 (2009/04)

වන යම් තැනැත්තකුගේ භාරයට ලබා දෙන ලෙසට,

අධිකරණය විසින් අතුරු නියමයක් කරනු ලැබිය හැකි ය.

(2) එකී නඩු විභාගය අවසාන වශයෙන් තීරණය කරන තෙක් එම සතා රැක බලා ගැනීම අවස්ථාවෝචිත පරිදි එම සත්ව රැකවරණ මධ්‍යස්ථානයේ, රාජ්‍ය නොවන සංවිධානයේ හෝ තැනැත්තාගේ කාර්යය සහ වගකීම විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් යම් වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් යම් තැනැත්තකු වරදකරු වන අවස්ථාවක දී මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ සම්බන්ධයෙන් නියම කරනු ලබන දණ්ඩනයට අමතරව —

(අ) එම සතා රාජසන්තක කිරීම සඳහා; හෝ

(ආ) එකී සතාගේ අයිතිය තහවුරු කිරීම මත සහ එකී වරද සිදු කරනු ලැබ ඇත්තේ හෝ සිදු කරනු ලැබීමට ප්‍රයත්න දරා ඇත්තේ, අයිතිකරුගේ දැනුම හෝ අන්‍යාකාර සම්බන්ධතාවකින් තොරව බව තහවුරු කිරීමෙන් පසු එම සතා අයිතිකරු වෙත භාර දෙනු ලැබීම සඳහා,

නියමයක් කරනු ලැබිය හැකි ය.

(4) සතකු රාජසන්තක කිරීම සඳහා නියමයක් කරනු ලැබ ඇති අවස්ථාවක දී, මහෙස්ත්‍රාත්වරයා විසින් (1) වන උපවගන්තිය යටතේ කරන ලද අතුරු නියමය ස්ථිර කරමින් එම සතාගේ රැකවරණය (1) වන උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) ඡේදවල පිළිවෙලින් සඳහන් අනුමත සත්ව රැකවරණ මධ්‍යස්ථානයට, රාජ්‍ය නොවන සංවිධානයට හෝ තැනැත්තාට භාර දෙන ලෙස ස්ථිර නියමයක් කරනු ලැබිය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) ඡේදවල පිළිවෙලින් සඳහන්ව ඇති

යම් සත්ව රැකවරණ මධ්‍යස්ථානයක්, යම් රාජ්‍ය නොවන සංවිධානයක් හෝ තැනැත්තකු—

(අ) විසින් පවත්වා ගෙන යා යුතු ප්‍රමිතීන්;

(ආ) විසින් අවශ්‍ය අනුමතය ලබා ගැනීම සහ ඒවා පිහිටුවීම සඳහා අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය;

(ඇ) අධීක්ෂණය කිරීම හෝ පරීක්ෂා කිරීම සඳහා අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය,

නිශ්චිතව දක්වමින් නියෝග සාදනු ලැබිය හැකි ය.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ "3ඈ" වගන්තිය "3ඉ" වගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ "3ඈ" වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 3ඈ වන වගන්තිය නැවත අංක කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ "3ඉ" වගන්තියට පෙරාතුව පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ "3ඈ" වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 3ඈ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"ii වන කොටස යටතේ සිදු කරන ලද වැරදි සඳහා වූ දණ්ඩන.

3ඈ. මේ පනතේ මේ කොටසේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධානයක් උල්ලංඝනය කරනු ලබන ඕනෑම තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් ලඝු නඩු විභාගයකින් පසු එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු තුනක කාලයක් නොඉක්මවන කාලයක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය."

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.